| මගේ අංකය<br>எனது இல<br>My No | DSD/HO/05/MF/15/SW/3-1 | ඔබේ අංකය<br>உமது இல<br>Your No | | දිනය<br>திகதி<br>Date | 2025.03.24 |
|---|---|---|---|---|---|

## සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ අංක :- 2025 /03

**පාලක මණ්ඩල/ විධායක කමිටු සභාපතිවරුන්,**
**සමෘද්ධි ප්‍රජාමූල බැංකු / බැංකු සමිති කළමණාකරුවන් වෙත,**

**<u>ක්ෂුද්‍ර මූල්‍ය අංශය විසින් සමෘද්ධි ප්‍රජාමූල බැංකු / බැංකු සමිති සඳහා මූල්‍ය පාලනය හා මූල්‍ය සීමාවන් පිළිබඳ බලතල පැවරීම.</u>**

ක්ෂුද්‍ර මූල්‍ය අංශය විසින් සමෘද්ධි ප්‍රජාමූල බැංකු / බැංකු සමිති සඳහා මූල්‍ය පාලනය හා මූල්‍ය සීමාවන් පිළිබඳ බලතල පැවරීම සම්බන්ධයෙන් 2025.02.25 දින පැවති ප්‍රජාමූල බැංකු / බැංකු සමිති කළමනාකරණ මණ්ඩලයේ උපදෙස් හා අනුමැතිය මත මෙම චක්‍රලේඛය නිකුත් කරමි.

**1.** සමෘද්ධි බැංකු /බැංකු සමිති සඳහා ඒ ඒ අනුමත කාර්යන් සඳහා වැය දැරිමේදි බලය දීම, අනුමත කිරිම, සහතික කිරිම සහ ගෙවීම යන මුලික ක්‍රියාවන් සිදුකල යුතු අතර එය පදනම් කර ගනිමින් බලතල පැවරීම සිදු කිරිමට මේ තුලින් අපේක්ෂා කෙරේ.

1.1. සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති අදාල වියදම් දැරීමේ දී සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති කළමනාකරණ මණ්ඩල අනුමැතිය මත නිකුත් කරනු ලබන චක්‍රලේඛ උපදෙස් පිළිපැදිය යුතුය.

1.2. ඒ අනුව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කලින් කලට නිකුත් කරනු ලබන චක්‍රලේඛ උපදෙස් ඒ සඳහා වලංගු වන්නේය.

1.3. මූල්‍ය බලතල පැවරීමේදී බලතල පවරන යම් නිළධාරියකුට එම බලතල සීමාවන් නොඉක්මවන පරිදි තම නිළධාරියකුට යම් විෂයක් වෙනුවෙන් බලතල පැවරිය හැකි වේ. එහෙත් එමගින් බලතල පවරනු ලබන නිළධාරියා ලෙස, තමා එම වගකීමෙන් නිදහස් නොවනු ඇති බැවින් මෙම උපදෙස් නිසි ලෙස අනුගමනය කිරීම සියළු දෙනාගේ සාමූහික වගකීමක් වේ.

**I. සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිතිය**

| ආයතනික මට්ටම | ගිණුම ආරම්භ කිරිමේ අරමුණ | ගිණුමේ නම | ගිණුම මෙහෙයවීමේ නිළධාරියා | ගිණුම ක්‍රියාත්මක කිරිමේ නිලධාරියා |
|---|---|---|---|---|
| සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිතිය | සමෘද්ධි ප්‍රජාමූල බැංකු කටයුතු මෙහෙය වීම /ණය ලබාදීම ප්‍රජාව සවිබල ගැන්වීම සඳහා වූ කටයුතු / ආයෝජන කළමනාකරණය/ණය හා සමුහ සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | කළමණාකරු සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිතිය | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) | බැංකු සමිති විධායක කමිටු සභාපති / උප සභාපති , බැංකු සමිති කළමණාකරු/ සහකාර කළමණාකරු |

## II. සමෘද්ධි ප්‍රජාමූල බැංකුව

| ආයතනික මට්ටම | ගිණුම ආරම්භ කිරීමේ අරමුණ | ගිණුමේ නම | ගිණුම මෙහෙයවීමේ නිළධාරියා | ගිණුම ක්‍රියාත්මක කිරීමේ නිලධාරියා |
|---|---|---|---|---|
| සමෘද්ධි ප්‍රජාමූල බැංකුව | සමෘද්ධි ප්‍රජාමූල බැංකු කටයුතු මෙහෙය වීම /ණය ලබාදීම ප්‍රජාව සවිබල ගැන්වීම/ආයෝජන කළමනාකරණය | කළමණාකරු සමෘද්ධි ප්‍රජාමූල බැංකුව. | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) | බැංකු පාලක මණ්ඩල සභාපති / උප සභාපති , බැංකු කළමනාකරු/ සහකාර කළමනාකරු |

දැනට ලබා දී ඇති උපදෙස් පරිදි බැංකු සමිති සඳහා ආයෝජන කටයුතු හා මෙහෙයුම් කටයුතු සඳහා රාජ්‍ය බැංකු වල ජංගම ගිණුම් හා ඉතිරි කිරීම් තැන්පතු ගිණුම් ආරම්භ කර පවත්වා ගෙන යාම සඳහා අවසර දී ඇත.සමෘද්ධි බැංකු සඳහාද ජංගම ගිණුම හා ඉතිරිකිරීම් තැන්පතු ගිණුම් රාජ්‍ය බැංකුවල ආරම්භ කර පවත්වාගෙන යෑම සඳහා අවසරය දී ඇත. සුවිශේෂී තත්වයකදී පමණක් රාජ්‍ය බැංකු හැර යම් පෞද්ගලික වානිජ බැංකුවක ජංගම ගිණුමක් හෝ ඉතිරි කිරීම් තැන්පත් ගිණුමක් ආරම්භ කිරීමට අවසර දී ඇති විටක හැර, වෙනත් කිසිදු විටක දී ජංගම ගිණුම් හා ඉතිරි කිරීම් තැන්පත් ගිණුම් පෞද්ගලික වානිජ බැංකු / සංවර්ධන බැංකු / ඉතිරි කිරීම් බැංකුවල ආරම්භ කිරීමට නොහැක.

දැනට අනුමත බැංකුවක පවත්වාගෙන යන ජංගම ගිණුම හෝ ඉතිරි කිරීම් තැන්පත් ගිණුමක් වසා වෙනත් බැංකුවක ගිණුමක් ආරම්භ කිරීමට යම් සුවිශේෂී තත්වයකදී අවශ්‍ය නම්, **<u>ඒ සඳහා අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය ) නිර්දේශය සහිත අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය මත පමණක් සිදුවිය යුතු බවට දන්වමි..</u>**

**2.** සමෘද්ධි බැංකු හා බැංකු සමිති අරමුදල් පදනම් කර ගනිමින් රාජකාරි අවශ්‍යතාවය මත ගමන් වියදම්, නිවාඩු දින වැටුප් හා අතිකාල ගෙවීම් කිරීම

**2.1** අතිකාල, අතට පාඩු හා දින වැටුප්

| තනතුර | උපරිම මාසික දීමනාව (රු.) අතිකාල/අතටපාඩු | අනුමත නිවාඩු දින ගණන (එක් නිලධාරියෙකුට) |
|---|---|---|
| 1. සමෘද්ධි බැංකු කළමනාකරු | අතට පාඩු - පැය 20 | 03 |
| 2. සමෘද්ධි බැංකු කාර්ය මණ්ඩලය 05 සඳහා | අතිකාල - පැය 20 | 03 |
| 3. සමෘද්ධි බැංකු සමිති කළමනාකරු | අතට පාඩු - පැය 10 | 02 |
| 4. සමෘද්ධි බැංකු සමිති කාර්ය මණ්ඩලය සඳහා | අතිකාල - පැය 10 | 02 |

2.2 **සමෘද්ධි බැංකු කාර්ය මණ්ඩලය ගමන් වියදම් දැරීම.**

| තනතුර | උපරිම මාසික දීමනාව (රු.) |
|---|---|
| 1. සමෘද්ධි බැංකු කළමනාකරු | 3,000 |
| 2. සමෘද්ධි සංවර්ධන නිළධාරී (කලාප සහකාර) | 2,000 |
| 3. ක්ෂේත්‍ර සමෘද්ධි සංවර්ධන නිළධාරීන් සඳහා (භාණ්ඩාගාර ප්‍රතිපාදන මත) | අනුමත දීමනාව |
| 4. බැංකු කාර්ය මණ්ඩලය සඳහා | කළමනාකරු පවරනු ලබන රාජකාරී මත |

2.3 **බැංකු සමිති කාර්ය මණ්ඩලය සඳහා ගමන් වියදම්**

| නිළධාරියාගේ තනතුර | උපරිම මාසික දීමනාව (රු.) |
|---|---|
| 1. සමෘද්ධි බැංකු සමිති කළමනාකරු | 3,000 (භාණ්ඩාගාර ප්‍රතිපාදන මත) |
| 2. සමෘද්ධි බැංකු සමිති කාර්ය මණ්ඩලය සඳහා | බැංකු සමිති කළමනාකරු පවරනු ලබන රාජකාරී මත. |

2.4 සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ගේ අතිකාල පැය වැටුප් ගණනය කිරීමේදී, මූලික වැටුප (Basic salary) පදනම් කරගත යුතුය. අතිකාල ලබා ගැනීමට නම් දිනකට පැය 01 ක් හෝ ඊට වැඩි කාලයක් සේවය කල යුතුය. යම් විටක පැයට අඩු කාලයක් සේවය කරන විට අතිකාල වැටුප් හිමි නොවේ. තවද, වැඩ කරන සතියේ දිනවල ප.ව. 4.30 සිට වැඩ කරන කාලය වෙනුවෙන් අතිකාල / අතට පාඩු දීමනා ලබා ගැනීමට හැකිවේ. සති අන්ත /රජයේ නිවාඩු දිනවල රාජකාරි ඉටු කිරීම වෙනුවෙන් කිසිදු විටක අතිකාල / අතට පාඩු දීමනා හිමි නොවේ.

2.5 සමෘද්ධි ප්‍රජා මූල බැංකු / බැංකු සමිති නිලධාරීන් සති අන්ත රාජකාරී වල නිරතවී දින වැටුප් ලබා ගැනීමට නම්, ඊට පෙර පහත තොරතුරු ඉදිරිපත් කර සමෘද්ධි ප්‍රජාමූල බැංකු කාර්ය මණ්ඩලය/ බැංකු සමිති කළමනාකරුගෙන් හා සමෘද්ධි බැංකු සමිති කාර්ය මණ්ඩලය, දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂකගේ අනුමැතිය ලබා ගැනීම අනිවාර්ය වේ.

* රාජකාරී ඉටු කරන දින
* රාජකාරියට වාර්තා කරන නිලධාරීන්ගේ නම් හා තනතුරු
* එක් එක් නිලධාරියා ඉටු කිරීමට අපේක්ෂිත රාජකාරි කටයුතු

2.6 සමෘද්ධි ප්‍රජාමූල බැංකුවල පැහැර හැරි ණය, සමථ මණ්ඩලයට ඉදිරිපත් කර විභාග කරන / පරීක්ෂණය කරන අවස්ථා සඳහා බැංකු කළමනාකරු සහභාගි විය යුතුය. ඒ සඳහා දින වැටුප් ලබා ගැනීමට හිමිකමක් ඇත. නිලධාරියා විසින් දින වැටුප් ඉල්ලීම සමග සමථ මණ්ඩල සභාපති නිකුත් කරන පැමිණීමේ සහතිකයද ඇමිණිය යුතුය. අවශ්‍යතාවය පරිදි වෙනත් නිලධාරියකු සහභාගි වන විටක එම නිලධාරියාට දින වැටුප් ලබා ගැනීමට හිමිකම ඇත. බැංකු හෝ බැංකු සමිති වෙනුවෙන් අධිකරණ කටයුතු සඳහා සහාභාගී වන විට සංයුක්ත දීමනාව හා සත්‍ය බස්ගාස්තුව ලබා ගැනීමට හැක.

2.7 සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති කළමනාකරු සඳහා අතට පාඩු දිමනා හා සමිති කාර්ය මණ්ඩලය සඳහා අතිකාල දීමනා ගෙවීම.

I. සමෘද්ධි ප්‍රජාමූල බැංකු බැංකු සමිති අතිකාල ගෙවීම මාසිකව අනිවාර්ය දීමනාවක් ලෙස නොව, සේවයේ අවශ්‍යතාවය පරිදි ගෙවීම් කළ යුතුය.
II. සමිති කාර්යමණ්ඩලය ලෙස ආයෝජන හා ගිණුම් කටයුතු සඳහා සෘජුව සම්බන්ධවන විෂය ලිපිකරුවන් හා සමිති කළමනාකරුට පමණක් අදාළ වේ.

## 3. ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටු පිහිටුවීම හා කාර්යයන්

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමෘද්ධි ගිණුම් චක්‍රලේඛ අංක 1/2025 හි ජේද 11 හි ප්‍රාදේශීය මට්ටම පිහිටුවා ඇති ප්‍රසම්පාදන කමිටුව හා ඒ සඳහා දී ඇති මූල්‍ය සීමාව තුළ සමෘද්ධි ප්‍රජා බැංකු හා බැංකු සමිති වලට අදාල කාර්යාල උපකරණ ඇතුළු භාණ්ඩ හා සේවා මිළදී ගැනීම හා වැඩ සඳහා ප්‍රසම්පාදන තීරණ ලබා ගත යුතුය.

**4.** සමෘද්ධි ප්‍රජාමූල බැංකු / බැංකු සමිති සඳහා මුද්‍රිත / මුද්‍රිත නොවන ලිපිද්‍රව්‍ය, බැංකු ප්‍රවර්ධන සඳහා භාණ්ඩ මිලට ගැනීම සඳහා සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති මට්ටමින් පහත පරිදි ප්‍රසම්පාදන කමිටුවක් පත්කර ගැනීමට හා මිලදී ගැනීම් සිදුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

i. විධායක කමිටු සභාපති - සභාපති
ii. සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති කළමනාකරු- සාමාජික
iii. සමෘද්ධි ප්‍රජාමූල බැංකු කළමනාකරු - අදාල කාර්යයට සම්බන්ධිත සමෘද්ධි බැංකුවේ / සුදුසු බැංකු කළමනාකරුවෙකු
iv. ව්‍යාපෘති කළමනාකරු -කමිටු ලේකම් ( ව්‍යාපෘති කළමනාකරු නොමැති විට වෙනත් සුදුසු නිලධාරියෙක් )

මිළ සැදැහුම් ක්‍රමය ( මිළ විමසීමක් කර) රු. 200,000/- දක්වා මිලදී ගැනීම් සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමට අදාල කටයුතු කළ හැක. මෙම කාර්ය කිරීමේදී රජයේ ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහයේ උපදෙස් අනුගමනය කළ යුතුය.

**5. ක්ෂුද්‍ර මුල්‍ය බැංකු /බැංකු සමිති අරමුදල් භාවිතා කර වත්කම් මිළදී ගැනීම හා මෙහෙයුම් වියදම් දැරීම.**

<u>සමෘද්ධි ප්‍රජාමූල බැංකු / බැංකු සමිති සඳහා මූල්‍ය බලතල විවිධ කාර්යන් සඳහා ලබා දීම</u>

| වැය විෂය | අනුමත සීමාව රු. | | බලය ලබාදීම | අනුමත කිරිම | සහතික කිරිම | ගෙවීම් |
|---|---|---|---|---|---|---|
| | බැංකුව | බැංකු සමිතිය | | | | |
| 1 මිලදී ගැනිම් - පරිගණක උපකරණ හා ඊට අදාළ තාක්ෂණික උපකරණ හා යටිතළ පහසුකම් සපයා ගැනිම වසරකට | රු. 800,000/- දක්වා | රු. 800,000/- දක්වා | දිස්ත්‍රික්/ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව | පාලක මණ්ඩල/ විධායක කමිටු අනුමැතිය /ආවරණ අනුමැතිය යටත්ව බැංකු /බැංකු සමිති කළමණාකරු (ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටු තීරණය මත) | සහකාර කළමණා කරු | මුදල් අයකැමි |
| | රු.800,000/-ට වැඩි | රු.800,000/-ට වැඩි | දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව | | | |
| 02.මිලදී ගැනිම් - කාර්යාල උපකරණ සඳහා වසරකට | රු. 150,000/- දක්වා | රු. 150,000/- දක්වා | පාලක මණ්ඩලය/ විධායක කමිටු සභාපති | පාලක මණ්ඩලය/ විධායක කමිටු සභාපති | සහකාර කළමණා කරු | මුදල් අයකැමි |
| | රු.150,000/-ට වැඩි සහ 250,000/- දක්වා | රු.150,000/-ට වැඩි සහ 250,000/- දක්වා | ප්‍රාදේශීය ලේකම් | පාලක මණ්ඩල/ විධායක කමිටු අනුමැතිය/ආවරණ අනුමැතිය යටත්ව බැංකු /බැංකු සමිති කළමණාකරු (01/2024 අංක 11 පරිදි ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටු තීරණය මත) | | |
| | රු. 250,000/-ට වැඩි සහ රු.500,000/- දක්වා | රු. 250,000/-ට වැඩි සහ රු.500,000/- දක්වා | දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ | | | |
| | රු.500,000/-ට වැඩි | රු.500,000/- වැඩි | දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව | | සහකාර කළමණා කරු | මුදල් අයකැමි |
| 3.සංග්‍රහ කටයුතු (මසකට උපරිම) | රු.7,000/- | රු.5,000/- | පාලක මණ්ඩලය/ විධායක කමිටුව | පාලක මණ්ඩල/ විධායක කමිටු අනුමැතිය/ආවරණ අනුමැතියට යටත්ව බැංකු /බැංකු සමිති කළමණාකරු | සහකාර කළමණා කරු | මුදල් අයකැමි |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 4.විධායක කමිටු/ පාලක මණ්ඩල සංග්‍රහ සඳහා (එක් අවස්ථාවක් සඳහා) | රු.5,000/- | රු.4,000/- | පාලක මණ්ඩලය/ විධායක කමිටුව | පාලක මණ්ඩල/ විධායක කමිටු අනුමැතිය/ආවරණ අනුමැතියට යටත්ව බැංකු /බැංකු සමිති කළමණාකරු | සහකාර කළමණාකරු | මුදල් අයකැමි |



| වැය විෂය | අනුමත සීමාව රු. | | බලය ලබාදීම | අනුමත කිරීම | සහතික කිරීම | ගෙවීම් |
|---|---|---|---|---|---|---|
| | බැංකුව | බැංකු සමිතිය | | | | |
| 5. උත්සව වියදම් (බැංකු හා බැංකු සමිති ආශ්‍රිත) (වසරකට එක් අවස්ථාවක් සඳහා) | ප්‍රධාන කාර්යාලයේ අනුමැතිය පරිදි | ප්‍රධාන කාර්යාලයේ අනුමැතිය පරිදි | අධ්‍යක්ෂ ජනරාල්/ බැංකු හා බැංකු සමිති කළමනාකරණ මණ්ඩලය | පාලක මණ්ඩල/ විධායක කමිටු අනුමැතිය/ආවරණ අනුමැතිය යටත්ව බැංකු /බැංකු සමිති කළමණාකරු | සහකාර කළමණාකරු | මුදල් අයකැමි |
| 6.සුළු මිලදී ගැනීම් | වසරකට රු. 120,000/- උපරිමයකට යටත්ව | වසරකට. රු.60,000/- උපරිමයකට යටත්ව | පාලක මණ්ඩලය/ විධායක කමිටුව | පාලක මණ්ඩල/ විධායක කමිටු අනුමැතිය/ආවරණ අනුමැතිය යටත්ව බැංකු /බැංකු සමිති කළමණාකරු | සහකාර කළමණාකරු | මුදල් අයකැමි |
| 7.ගොඩනැගිලි කුලී | පූර්ව අනුමැතිය මත | පූර්ව අනුමැතිය මත | අධ්‍යක්ෂ ජනරාල්/ බැංකු කළමනාකරණ මණ්ඩලය | පාලක මණ්ඩල/ විධායක කමිටු අනුමැතිය/ආවරණ අනුමැතිය යටත්ව බැංකු /බැංකු සමිති කළමණාකරු | සහකාර කළමණාකරු | මුදල් අයකැමි |
| 8.1කම්කරු/ පිරිසිදු කිරීම් සඳහා/ දිනකට (එක් අයෙකුට) | රු. 1,000/- | රු. 1,000/- | පාලක මණ්ඩලය/ විධායක කමිටුව | පාලක මණ්ඩල/ විධායක කමිටු අනුමැතිය/ආවරණ අනුමැතිය යටත්ව බැංකු /බැංකු සමිති කළමණාකරු | සහකාර කළමණාකරු | මුදල් අයකැමි |
| 8.2 මුරකරු ගාස්තු දිනකට (එක් අයෙකුට) දෛනික කුලී පදනම මත. | රු. 1,000/- | රු. 1,000/- | පාලක මණ්ඩලය/ විධායක කමිටුව | පාලක මණ්ඩල/ විධායක කමිටු අනුමැතිය/ආවරණ අනුමැතිය යටත්ව බැංකු /බැංකු සමිති කළමණාකරු | සහකාර කළමණාකරු | මුදල් අයකැමි |
| 9. ප්‍රවර්ධන වැඩසටහන් වෙනුවෙන් එක් වරකට රු. 5,000/- (වසරකට උපරිම අවස්ථා හතරක් සඳහා) | රු. 20,000/- | රු. 20,000/- | පාලක මණ්ඩලය/ විධායක කමිටුව | පාලක මණ්ඩල/ විධායක කමිටු අනුමැතිය/ආවරණ අනුමැතිය යටත්ව බැංකු /බැංකු සමිති කළමණාකරු | සහකාර කළමණාකරු | මුදල් අයකැමි |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 10.පාලක මණ්ඩල/ විධායක කමිටු රැස්වීම් දීමනාව (එක් රැස්වීමක් සඳහා) | සභාපති- රු. 3,500/- සෙසු සාමාජිකයින්ට රු.2,500/- බැගින් | සභාපති- රු.3,500/- සෙසු සමාජිකයින්ට රු.2,500/- බැගින් | පාලක මණ්ඩලය/ විධායක කමිටුව | පාලක මණ්ඩල/ විධායක කමිටු අනුමැතිය/ආවරණ අනුමැතිය යටත්ව බැංකු /බැංකු සමිති කළමණාකරු | සහකාර කළමණා කරු | මුදල් අයකැමි |



| වැය විෂය | අනුමත සීමාව රු. | | බලය ලබාදීම | අනුමත කිරීම | සහතික කිරීම | ගෙවීම් |
|---|---|---|---|---|---|---|
| | බැංකුව | බැංකු සමිතිය | | | | |
| 11.පාලක මණ්ඩල / විධායක කමිටු සභාපතිවරුන්,ණය හා බැංකු කටයුතු සඳහා පැමිණීමේ දීමනාව (මාසිකව) | රු. 2,000/- | රු.2,500/- | පාලක මණ්ඩලය/ විධායක කමිටුව | පාලක මණ්ඩල/ විධායක කමිටු අනුමැතිය/ආවරණ අනුමැතිය යටත්ව බැංකු /බැංකු සමිති කළමණාකරු | සහකාර කළමණා කරු | මුදල් අයකැමි |
| 12.ප්‍රවාහන වියදම් (මාසිකව)බැංකු වෙත පැවරු .රාජකාරි වෙනුවෙන් පොදු ප්‍රවාහන මාධ්‍ය භාවිතා කිරීම වෙනුවෙන් දරණ ලද වියදම් (අදාළ බිල්පත් සදහා) | රු.7,500/- | රු.5,000/- | පාලක මණ්ඩලය/ විධායක කමිටුව/ | පාලක මණ්ඩල/ විධායක කමිටු අනුමැතිය/ආවරණ අනුමැතිය යටත්ව බැංකු /බැංකු සමිති කළමණාකරු | සහකාර කළමණා කරු | මුදල් අයකැමි |
| 13.මුද්දර ගාස්තු | අවශ්‍යතාවය පරිදි | අවශ්‍යතාවය පරිදි | පාලක මණ්ඩලය/ විධායක කමිටුව/ | පාලක මණ්ඩල/ විධායක කමිටු අනුමැතිය/ආවරණ අනුමැතිය යටත්ව බැංකු /බැංකු සමිති කළමණාකරු | සහකාර කළමණාක රු | මුදල් අයකැමි |
| 14. බදු ගාස්තු/ බැංකු ගාස්තු / ආයතනික බිල්පත් ගාස්තු | අදාල බිල්පතේ සදහන් පරිදි | අදාල බිල්පතේ සදහන් පරිදි | පාලක මණ්ඩලය/ විධායක කමිටුව | පාලක මණ්ඩල/ විධායක කමිටු අනුමැතිය/ආවරණ අනුමැතිය යටත්ව බැංකු /බැංකු සමිති කළමණාකරු | සහකාර කළමණාක රු | මුදල් අයකැමි |
| 15.1 මුද්‍රිත නොවන බැංකු ලිපිද්‍රව්‍ය වෙළඳපළින් මිලදී ගැනීමට දරණ වියදම ( වසරකට) | රු.100,000/- | රු.100,000/- | පාලක මණ්ඩලය/ විධායක කමිටුව | පාලක මණ්ඩල/ විධායක කමිටු අනුමැතිය/ආවරණ අනුමැතිය යටත්ව බැංකු /බැංකු සමිති කළමණාකරු | සහකාර කළමණාක රු | මුදල් අයකැමි |
| 15.2 ප්‍රජාමූල බැංකු/ බැංකු සමිති සඳහා මුද්‍රිත බැංකු ලිපි ද්‍රව්‍ය (චක්‍රලේඛ මගින් උපදෙස් ලබා දී ඇති ලිපි ද්‍රව්‍ය සඳහා) | රු.500,000/- දක්වා | රු.500,000/- දක්වා | පාලක මණ්ඩලය/ විධායක කමිටුව | පාලක මණ්ඩල/ විධායක කමිටු අනුමැතිය/ආවරණ අනුමැතිය යටත්ව බැංකු /බැංකු සමිති කළමණාකරු | සහකාර කළමණාක රු | මුදල් අයකැමි |
| | රු.500,000/- සිට රු.1,000,000/ දක්වා- | රු.500,000/- සිට රු.1,000,000/- දක්වා | දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ | | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | රු.1,000,000/- වැඩි | රු.1,000,000/- වැඩි | අධ්‍යක්ෂ ජනරාල් | | | |
| 16. බැංකු / බැංකු සමිති වාර්ෂික සම්මේලනය | රු.25,000/- (ප්‍රජාමූල සංවිධාන ඇගයීමේ කටයුතු හා පරිපාලන වියදම් සඳහා) | රු.30,000/- බැංකු 7කට වැඩිනම් 50,000 (ප්‍රජාමූල සංවිධාන ඇගයීමේ කටයුතු හා පරිපාලන වියදම් සඳහා) | පාලක මණ්ඩලය/ විධායක කමිටුව | අය-වැය ඇස්තමේන්තු ඉදිරිපත් කර පාලක මණ්ඩල/ විධායක කමිටු අනුමැතිය/ආවරණ අනුමැතිය යටත්ව බැංකු /බැංකු සමිති කළමණාකරු | | |

සටහන්:- ඉහත 15.2 හිදී ප්‍රජාමූල බැංකු/ බැංකු සමිති සඳහා මුද්‍රිත බැංකු ලිපි ද්‍රව්‍ය මුද්‍රණය කිරීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධි විධාන වලට අනුව කටයුතු කළ යුතුය.



| වැය විෂය | අනුමත සීමාව රු. | | බලය ලබාදීම | අනුමත කිරිම | සහතික කිරිම | ගෙවීම් |
|---|---|---|---|---|---|---|
| | බැංකුව | බැංකු සමිතිය | | | | |
| 17.නිතිඥ ගාස්තු / ණය ආපසු අයකර ගැනීම .(අදාළ බිල්පත්, ඉල්ලීම් මත අනුමත ගාස්තු) | අවශ්‍යතාව පරිදි | අවශ්‍යතාව පරිදි | පාලක මණ්ඩලය/ විධායක කමිටුව/ දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ | පාලක මණ්ඩල/ විධායක කමිටු අනුමැතිය/ආවරණ අනුමැතිය යටත්ව බැංකු /බැංකු සමිති කළමණාකරු | සහකාර කළමණා කරු | මුදල් අයකැමි |
| 18.පරිගණක පුහුණු ලාභීන් දීමනා (දිනකට) (අනුමත පුහුණුලාභින් සඳහා) | රු.500/- (දිනකට) එක් අයෙකුට | රු.500/- (දිනකට) එක් අයෙකුට | පාලක මණ්ඩලය/ විධායක කමිටුව/ දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ | පාලක මණ්ඩල/ විධායක කමිටු අනුමැතිය/ආවරණ අනුමැතිය යටත්ව බැංකු /බැංකු සමිති කළමණාකරු | සහකාර කළමණා කරු | මුදල් අයකැමි |
| 19.කාර්යය මණ්ඩල පුහුණු හා කුසලතා සංවර්ධනය පුහුණු ගාස්තුව | අදාල පුහුණුව පරිදි අනුමත මුදල | අදාල පුහුණුව පරිදි අනුමත මුදල | අධ්‍යක්ෂ ජනරාල්/ බැංකු කළමනාකරණ මණ්ඩලය | පාලක මණ්ඩල/ විධායක කමිටු අනුමැතිය/ආවරණ අනුමැතිය යටත්ව බැංකු /බැංකු සමිති කළමණාකරු | සහකාර කළමණා කරු | මුදල් අයකැමි |
| 20.ක්ෂේත්‍ර සමෘද්ධි සංවර්ධන නිළධාරී ලිපිද්‍රව්‍ය වාර්ෂිකව එක් නිලධාරියකුට | රු.3,500/- (වාර්ෂිකව - ස්ථිර වසමට හා වැඩබලන සියළු වසම් සඳහා) | අදාල නැත. | පාලක මණ්ඩලය | පාලක මණ්ඩල ආවරණ අනුමැතිය යටත්ව බැංකු /බැංකු සමිති කළමණාකරු | සහකාර කළමණා කරු | මුදල් අයකැමි |
| 21.කාර්යාල උපකරණ නඩත්තු හා අලුත්වැඩියා වියදම් හා ගොඩනැගිලි හදිසි නඩත්තු වියදම් | අදාල ආයතන වල බිල්පත් ආවරණ අනුමැතිය මත පාලක මණ්ඩලය- රු50.000/ හෝ ඊට අඩු | අදාල ආයතන වල බිල්පත් ආවරණ අනුමැතිය මත විධායක කමිටුව -රු.50.000/ හෝ ඊට අඩු | පාලක මණ්ඩලය/ විධායක කමිටුව | පාලක මණ්ඩල/ විධායක කමිටු අනුමැතිය/ආවරණ අනුමැතිය යටත්ව බැංකු /බැංකු සමිති කළමණාකරු මෙහිදී රු.25,000/- ට අඩු නඩත්තු හා | සහකාර කළමණාක රු | මුදල් අයකැමි |
| | අදාල ආයතන වල බිල්පත් පරිදි පූර්ව අනුමැතිය මත ප්‍රා/ලේ | අදාල ආයතන වල බිල්පත් පරිදි පූර්ව අනුමැතිය මත | ප්‍රාදේශීය ලේකම් | | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | රු.50,001/-<br>රු.75,000<br>දක්වා- | ප්‍රා/ලේ<br>රු.50,001/-<br>රු.75,000<br>දක්වා - | | අළුත්වැඩියා සඳහා ආවරණ අනුමැතියට යටත්ව සිදු කල යුතු අතර රු.25,000/- වැඩි විටකදී බලය ලබාගත් පසුව අනුමැතිය දිය යුතුය. | | |
| | අදාල ආයතන වල බිල්පත් පරිදි පූර්ව අනුමැතිය මත<br>දිස්. සමෘ. අධ්‍ය<br>රු.75,001- වැඩි<br>රු100,000/-<br>දක්වා | අදාල ආයතන වල බිල්පත් පරිදි පූර්ව අනුමැතිය මත<br>දිස්. සමෘ. අධ්‍ය<br>රු.75,001-<br>රු100,000/-<br>දක්වා | දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ | | | |
| | අදාල ආයතන වල බිල්පත් පරිදි පූර්ව අනුමැතිය මත<br>අධ්‍ය. ක්ෂුද්‍ර මූල්‍ය<br>රු.100,001/-<br>වැඩි<br>රු.500,000/-<br>දක්වා | අදාල ආයතන වල බිල්පත් පරිදි පූර්ව අනුමැතිය මත<br>අධ්‍ය. ක්ෂුද්‍ර මූල්‍ය<br>රු.100,001/-<br>වැඩි<br>රු.500,000/-<br>දක්වා | අධ්‍යක්ෂ -ක්ෂුද්‍ර මූල්‍ය | | | |
| | අදාල ආයතන වල බිල්පත් පරිදි පූර්ව අනුමැතිය මත<br>අධ්‍යක්ෂ ජනරාල්<br>රු.500,001/-<br>වැඩි<br>රු.1,000,000/-<br>දක්වා | අදාල ආයතන වල බිල්පත් පරිදි පූර්ව අනුමැතිය මත<br>අධ්‍යක්ෂ ජනරාල්<br>රු.500,001/-<br>වැඩි<br>රු.1,000,000<br>/- දක්වා | අධ්‍යක්ෂ ජනරාල් | | | |
| 22.විගණන හා විමර්ශන ගාස්තු | කළමනාකරණ අනුමැතිය මත | කළමනාකරණ අනුමැතිය මත | අධ්‍යක්ෂ ජනරාල්/ බැංකු කළමනාකරණ මණ්ඩලය | පාලක මණ්ඩල අනුමැතිය/ආවරණ අනුමැතිය යටත්ව බැංකු /බැංකු සමිති කළමණාකරු | සහකාර කළමණාකරු | මුදල් අයකැමි |
| 23.1පරිගණක සේවා ගාස්තු | රු.6,481.50+ රජයේ බදු | රු.4,000+ රජයේ බදු | පාලක මණ්ඩලය | පාලක මණ්ඩල අනුමැතිය/ආවරණ අනුමැතිය යටත්ව බැංකු /බැංකු සමිති කළමණාකරු | සහකාර කළමණාකරු | මුදල් අයකැමි |
| 23.2 Mobile App සඳහා | රු.175+ රජයේ බදු | අදාල නැත. | පාලක මණ්ඩලය/ විධායක කමිටුව | පාලක මණ්ඩල/ විධායක කමිටු අනුමැතිය/ආවරණ අනුමැතිය යටත්ව බැංකු /බැංකු සමිති කළමණාකරු | සහකාර කළමණාකරු | මුදල් අයකැමි |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 23.3 කෙටි පණිවුඩ සේවා ගාස්තු | රු. 300/- | රු. 300/- | පාලක මණ්ඩලය/ විධායක කමිටුව | පාලක මණ්ඩල/ විධායක කමිටු අනුමැතිය/ආවරණ අනුමැතිය යටත්ව බැංකු /බැංකු සමිති කළමණාකරු | සහකාර කළමණාක රු | මුදල් අයකැමි |
| 24.බැංකු හා බැංකු සමිති සඳහා Sever පහසුකම් ගාස්තු | රු. 4,603.69 + රජයේ බදු | රු. 4,603.69 + රජයේ බදු | පාලක මණ්ඩලය/ විධායක කමිටුව | පාලක මණ්ඩල/ විධායක කමිටු අනුමැතිය/ආවරණ අනුමැතිය යටත්ව බැංකු /බැංකු සමිති කළමණාකරු | සහකාර කළමණාක රු | මුදල් අයකැමි |
| 25.රක්ෂණ ගාස්තු (අතුරුදි./ ශාරීරික අනතුරු) | චක්‍රලේඛ උපදෙස් පරිදි | චක්‍රලේඛ උපදෙස් පරිදි | පාලක මණ්ඩලය/ විධායක කමිටුව | පාලක මණ්ඩල/ විධායක කමිටු අනුමැතිය/ආවරණ අනුමැතිය යටත්ව බැංකු /බැංකු සමිති කළමණාකරු | සහකාර කළමණාක රු | මුදල් අයකැමි |
| 26.පුවත්පත් සහ සඟරා ගාස්තු | රු. 2,000/- (මසකට) | රු. 2,000/- (මසකට) | පාලක මණ්ඩලය/ විධායක කමිටුව | පාලක මණ්ඩල/ විධායක කමිටු අනුමැතිය/ආවරණ අනුමැතිය යටත්ව බැංකු /බැංකු සමිති කළමණාකරු | සහකාර කළමණාක රු | මුදල් අයකැමි |
| **වැය විෂය** | **අනුමත සීමාව රු.** | | **බලය ලබාදීම** | **අනුමත කිරීම** | **සහතික කිරීම** | **ගෙවීම්** 8 |
| | **බැංකුව** | **බැංකු සමිතිය** | | | | |
| 27.බැංකු/ බැංකු සමිති ප්‍රගති සමාලෝචන කටයුතු (එක් රැස්වීමක් සඳහා) | උපරිම රු. 15,000/- | එක් අයෙකු සඳහා රු.500/- උපරිමයකට යටත්ව | පාලක මණ්ඩලය/ විධායක කමිටුව | පාලක මණ්ඩල/ විධායක කමිටු අනුමැතිය/ආවරණ අනුමැතිය යටත්ව බැංකු /බැංකු සමිති කළමණාකරු. | සහකාර කළමණාක රු | මුදල් අයකැමි |
| 28.සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති ලියාපදිංචි ගාස්තු | චක්‍රලේඛ පරිදි | චක්‍රලේඛ උපදෙස් පරිදි | පාලක මණ්ඩලය/ විධායක කමිටුව | පාලක මණ්ඩල/ විධායක කමිටු අනුමැතිය/ආවරණ අනුමැතිය යටත්ව බැංකු /බැංකු සමිති කළමණාකරු | සහකාර කළමණාක රු | මුදල් අයකැමි |
| 29.ජල බිල්පත් ගාස්තු විදුලි බිල්පත් ගාස්තු | ජලසම්පාදන /විදුලි බල මණ්ඩලයට මාසික බිල්පත/නිවේදන යේ සදහන් මුදල. | ජලසම්පාදන /විදුලි බල මණ්ඩලයට මාසික බිල්පත/ නිවේදනයේ සදහන් මුදල. | පාලක මණ්ඩලය/ විධායක කමිටුව | පාලක මණ්ඩල/ විධායක කමිටු අනුමැතිය/ආවරණ අනුමැතිය යටත්ව බැංකු /බැංකු සමිති කළමණාකරු | සහකාර කළමණාක රු | මුදල් අයකැමි |
| 30.ගොඩනැගිලි නඩත්තු හා සේවා/ ගොඩනැගිලි කුලී | ගිවිසුම් ගතවු පරිදි හා දෙපාර්තමේන්තු වේ පූර්ව අවසරය මත | ගිවිසුම් පරිදි හා පූර්ව හා දෙපාර්තමේන් තුවේ අවසරය මත | අධ්‍යක්ෂ ජනරාල්/ බැංකු කළමනාකරණ මණ්ඩලය | පාලක මණ්ඩල/ විධායක කමිටු අනුමැතිය/ආවරණ අනුමැතිය යටත්ව බැංකු /බැංකු සමිති කළමණාකරු | සහකාර කළමණාක රු | මුදල් අයකැමි |
| 31.වරිපනම් හා බලපත්‍ර ගාස්තු | පළාත් පාලන ආයතන නිකුත් කරන රිසිට් | පළාත් පාලන ආයතන නිකුත් කරන | පාලක මණ්ඩලය/ විධායක | පාලක මණ්ඩල/ විධායක කමිටු අනුමැතිය/ආවරණ | සහකාර කළමණාක රු | මුදල් අයකැමි |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | පතෙහි සදහන් මුදල | රිසිට් පතෙහි සදහන් මුදල | කමිටුව | අනුමැතිය යටත්ව බැංකු /බැංකු සමිති කළමණාකරු | | |
| 32.ප්‍රජාමූල සංවිධාන පුහුණු හා සංවර්ධනය | චක්‍රලේඛ උපදෙස් පරිදි | චක්‍රලේඛ උපදෙස් පරිදි | පාලක මණ්ඩලය/ විධායක කමිටුව | පාලක මණ්ඩල/ විධායක කමිටු අනුමැතිය/ආවරණ අනුමැතිය යටත්ව බැංකු /බැංකු සමිති කළමණාකරු | සහකාර කළමණාකරු | මුදල් අයකැමි |
| 33.1.. දුරකථන හා අන්තර්ජාල පහසුකම් ගාස්තු(මසකට) | රු.10,000/- | රු.7,500/- | පාලක මණ්ඩලය/ විධායක කමිටුව | පාලක මණ්ඩල/ විධායක කමිටු අනුමැතිය/ආවරණ අනුමැතිය යටත්ව බැංකු /බැංකු සමිති කළමණාකරු | සහකාර කළමණාකරු | මුදල් අයකැමි |
| 33.2.Mobile App පහසුකම සදහා | මාසයක් සදහා රු. 500 (ක්ෂේත්‍ර ගත සමෘද්ධි සංවර්ධන නිලධාරි) | -- | පාලක මණ්ඩලය | පාලක මණ්ඩල අනුමැතිය/ආවරණ අනුමැතිය යටත්ව බැංකු /බැංකු සමිති කළමණාකරු | සහකාර කළමණාකරු | මුදල් අයකැමි |



| වැය විෂය | අනුමත සීමාව රු. | | බලය ලබාදීම | අනුමත කිරීම | සහතික කිරීම | ගෙවීම |
|---|---|---|---|---|---|---|
| | බැංකුව | බැංකු සමිතිය | | | | |
| 34.අතට පාඩු/ අතිකාල දීමනා | උපරිම මසකට පැය 20 චක්‍රලේඛ උපදෙස් පරිදි | උපරිම මසකට පැය 10 චක්‍රලේඛ උපදෙස් පරිදි | පාලක මණ්ඩලය/ විධායක කමිටුව | පාලක මණ්ඩලඅනුමැතිය/ ආවරණ අනුමැතිය යටත්ව බැංකු කළමණාකරු / බැංකු සමිති කළමනාකරු | සහකාර කළමණාකරු | මුදල් අයකැමි |
| 35.නිවාඩු දින වැටුප් | දින 03 චක්‍රලේඛ උපදෙස් පරිදි | දින 02 චක්‍රලේඛ උපදෙස් පරිදි | පාලක මණ්ඩලය/ විධායක කමිටුව | පාලක මණ්ඩල අනුමැතිය/ආවරණ අනුමැතිය යටත්ව බැංකු කළමණාකරු | සහකාර කළමණාකරු | මුදල් අයකැමි |
| 36.බාහිර විගණන ගාස්තු | චක්‍රලේඛ උපදෙස් පරිදි පූර්ව අවසරය මත | චක්‍රලේඛ උපදෙස් පරිදි පූර්ව අවසරය මත | අධ්‍යක්ෂ ජනරාල්/ බැංකු හා බැංකු සමිති කළමනාකරණ මණ්ඩලය | පාලක මණ්ඩල/ විධායක කමිටු අනුමැතිය/ආවරණ අනුමැතිය යටත්ව බැංකු /බැංකු සමිති කළමණාකරු | සහකාර කළමණාකරු | මුදල් අයකැමි |
| 37.කාර්යාල උපකරණ සේවා ගාස්තු (වසරකට) | අදාල සේවා සපයන ආයතනය ඇති කර ගත් ගිවිසුමකට අනුව | අදාල සේවා සපයන ආයතනය ඇති කර ගත් ගිවිසුමකට අනුව | පාලක මණ්ඩලය/ විධායක කමිටුව | පාලක මණ්ඩල/ විධායක කමිටු අනුමැතිය/ආවරණ අනුමැතිය යටත්ව බැංකු /බැංකු සමිති කළමණාකරු | සහකාර කළමණාකරු | මුදල් අයකැමි |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | | |
| 38. ගොඩනැගිලි ඉදි කිරීම් හා සංවර්ධන අළුත්වැඩියා (ප්‍රධාන කාර්යාලයේ නිරීක්ෂණය මත) | රු.10,000,000/- දක්වා | රු.10,000,000/- දක්වා | අධ්‍යක්ෂ ජනරාල් | පාලක මණ්ඩල/ විධායක කමිටු අනුමැතිය බැංකු /බැංකු සමිති කළමණාකරු | සහකාර කළමණාකරු | මුදල් අයකැමි |
| | රු.10,000,000/- ට වැඩි | රු.10,000,000/- ට වැඩි | බැංකු හා බැංකු සමිති කළමනාකරණ මණ්ඩලය | | | |

5.2 හදිසි, අත්‍යාවශ්‍ය හා දෛනික කටයුතු සඳහා යම් මිලදී ගැනීමක්, වියදමක් , ගෙවීමක් කිරීමේදී සමෘද්ධි බැංකු /සමිති කළමනාකරු ආවරණ අනුමැතිය මත අදාල කාර්ය/මිලදී ගැනීම සිදුකර පසුව අනුමැතියට ඉදිරිපත්කල යුතුය.
අනිකුත් අවස්ථාවලදී පූර්ණ අනුමැතිය යටතේ සිදු කිරීමට වග බලා ගැනීම වඩාත් සුදුසු වේ.
5.3 අනුමත කිරීම, සහතික කිරීම, ගෙවීම් කිරීම යන දැ සිදුකල බව සනාථ කිරීමට අදාල නිලධාරීන් විසින් මුදල් හර සඳහා හෝ ගෙවීම් වවුචර් වල අත්සන් කිරීම සිදු කල යුතුය

**භාණ්ඩ හා සේවා මිලදී ගැනිම**

සැපයුම් හා සේවා ඉටු කර ගැනිමේදි මුදල් රෙගුලාසි හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස් අනුගමනය කළ යුතු අතර වාර්ෂික ඇස්තමේන්තු ගත ප්‍රසම්පාදන සීමාවන්ද සැලකිල්ලට ගත යුතුය.

යම් අවස්ථාවක එම සීමාවන් ඉක්මවා වියදම් දැරිමට සිදුවන අවස්ථාවල ප්‍රධාන කාර්යාලයේ ක්ෂුද්‍ර මූල්‍ය අංශය වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුතුය.
රජයේ අනුමත ආයතන එකකින් හෝ විධිමත් පරිදි ආයතන වලින් මිල ගණන් ලබා ගැනීමටත්, ප්‍රසම්පාදන ක්‍රමවේද අනුගමනය කරමින් මිලදි ගැනිම්/ අදාල කාර්යය ඉටුකර ගැනිමට බලය ඇත.



2013 අංක 01 දරණ දිවිනැගුම පනත හා 2017 අංක 02 දරණ සමෘද්ධි සංශෝධිත පනතේ පහත පරිද සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති කළමනාකරණ මණ්ඩලය විසින් සමස්ථ සමෘද්ධි ප්‍රජාමූල බැංකු පද්ධතියේ මූල්‍ය කටයුතු, බැංකු අධීක්ෂණය හා නියාමනය සිදුකරන බැවින් එම අනුමැතිය යටතේ මෙම සියළු උපදෙස් හා මග පෙන්වීම් නිකුත් කරනු ලබන බව සඳහන් කරමි.

**6. ඉහත කාර්යයන් අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙල**

සමෘද්ධි ප්‍රජාමූල බැංකු / බැංකු සමිති හා මහා සංගමය යටතේ පවතින අරමුදල් කළමනාකරණය කරගනිමින් වාර්ෂික වියදම් ඇස්තමේන්තුගත සීමාවන් තුල ඒ ඒ විෂයන් සඳහා වැය දැරිමට අදාල පාලක මණ්ඩල/ විධායක කමිටු නිලධාරින්ට අවසර ඇත. එසේම යම් කාර්යයක් කිරීමට බලය දුන් පමණින් හෝ අනුමත කළ පමණින් අදාල ගෙවීම නොකරන අවස්ථා පැවතිය හැක. ඒ සඳහා අදාල විධිමත් ලේඛන සහතික කිරිමේ නිළධාරියා ඉල්ලුම් කරනු ලබන අවස්ථාවලදි එම ලේඛන සැපයීම විෂයභාර නිළධාරියාගේ වගකීම වේ.

ක්ෂුද්‍ර මූල්‍ය අංශයේ, මහා සංගමයේ හා සමෘද්ධි බැංකු පද්ධතියේ පවතින අරමුදල් විධිමත් කළමනාකරණයකින් යුතු මූල්‍ය පාලනයක් සහිතව පවත්වාගෙන යා යුතු වේ. සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති මේ වන විටත් ප්‍රායෝගිකව සමෘද්ධි පනත අනුව ක්‍රියාත්මක වන බැවින් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය නියාමනය සහ රජයේ චක්‍රලේඛවලට අනුගත වෙමින් එදිනෙදා රාජකාරී සිදුකිරීම සියළු දෙනාගේ වගකීමක් බව සඳහන් කරමි.

මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය හා අදාළ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ චක්‍රලේඛ උල්ලංඝනය නොවන ආකාරයට අදාල ගෙවීම් සිදු කිරීමට කටයුතු කළ යුතුය.

ඒ තුලින් මනාව මූල්‍ය විනය ආරක්ෂා කරගනිමින් දේශයේ සෞභාග්‍ය කරා ගමන් කරනු ලබන කාර්යය ඉටු කිරිම සඳහා සහයෝගය දැක්විම ඔබ ඇතුළු අප සැමගේ ජාතික වගකීම හා යුතුකම බවද වැඩිදුරටත් දන්වනු කැමැත්තෙමි.

මෙම මූල්‍ය පාලනය හා මූල්‍ය සීමාවන් පිළිබඳ බලතල පැවරීම 2025 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන බවද, වැඩිදුරටත් දන්වා සිටිමි.

සී.ඩී.කළුආරච්චි.
අධ්‍යක්ෂ ජනරාල් (සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව)
සභාපති (සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති කළමනාකරණ මණ්ඩලය)

**පිටපත් :-**

1. ලේකම් - ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්විම් අමාත්‍යාංශය - කා.දැ.ස.
2. දිස්ත්‍රික් ලේකම්/ දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කා.දැ.ස./අ.ක.ස
3. ප්‍රධාන ගණකාධිකාරි , සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - අ.ක.ස.
4. දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. - අ.ක.ස.
5. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - අ.ක.ස.
6. ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය. - කා.දැ.ස./අ.ක.ස.
7. දිස්ත්‍රික් නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අ.ක.ස.
8. සභාපති, සමෘද්ධි ප්‍රජාමූල බැංකු මහා සංගමය - කා.දැ.ස /අ.ක.ස.